HNB GRAMEEN

# මෙහෙවර

අඳුර දුරලන සොඳුරු මෙහෙවර

2018 ජනවාරි - පෙබරවාරි කලාපය









## සුපිරි මොළකරුවන්ගේ දැනුම් සංග්‍රාමයට

## බලඇණිය තෝරාගැනීම


පෙබ. 16

HNB GRAMEEN iQ MASTER

දැනුමෙන් දිනුම

SEASON 02

# බොලිවුඩය දිග්විජය කළ රජු



# KING KHAN




ඔහු උපත ලැබුවේ 1965 නොවැම්බර් 02 දාකය. ඒ ඉන්දියාවේ නවදිල්ලියේ දීය. මෙම දරුවා උපතින්ම මුස්ලිම් ජාතිකයකු විය. දරුවා කුඩා කල සිටම තම අධ්‍යාපනයට ක්‍රීඩාවට සහ රංගනයට විශේෂ උනන්දුවක් දැක්වීය. මේ නිසාම මෙකී අංශවලින් පාසැලේ පැවැත්වූ තරඟ වලින් විවිධ සම්මාන ලබාගෙන ශාන්ත කොලොම්බස් පාසැලේ දීප්තිමත් තරුවක් බවට පත් වීමට මේ ශිෂ්‍යායාට හැකියාව ලැබිණි.

පාසල් අධ්‍යාපනයෙන් පසු උපාධිය ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රයෙන් හැදෑරීමට මෙම තරුණයා හන්ස් රාජ් විද්‍යාලයට ඇතුලත් විය. උපාධිය ලබා ගැනීමෙන් පසුව ඔහු සන්නිවේදන අංශයෙන් පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා, ජම්යා මිලා ඉස්ලාම්, විශ්ව විද්‍යාලයට ඇතුලත් විය. ඔහු තමන්ගේ අධ්‍යාපනය නිසි ලෙස හමාර කළේය.

ඔහු අධ්‍යාපනය ලබන අතරතුරම එනම් 1980 අග භාගයේ දී විවිධ රූපවාහිනී ටෙලිනාට්‍ය හා වැඩසටහන් වලට සම්බන්ධ විය. ඔහුගේ ප්‍රථම චිත්‍රපටයේ ඔහු සම්බන්ධවූයේ වීරයා චරිතයටයි. මෙම චිත්‍රපටියේ නම,දීවානා, විය දැන් ඔබ මෙම අසහාය චරිතය ගැන දන්නවා ඇතැයි සිතමි. මොහු අන්කවරෙකුවත් නොව හින්දි චිත්‍රපට ලෝකයේ සිහින කුමරා නමින් විරුදාවලිය ලත්, ශාරුක්ඛාන්ය, මෙම දීවානා චිත්‍රපටය ජනතාවට නැරඹීමට වරම් ලැබුනේ 1992 වසරේ දීය. මෙම ප්‍රථම චිත්‍රපටයෙන්ම ඔහුගේ අනභිබවනීය රංගනය උදෙසා ෆිල්ම් ෆෙයාර් **(Film Fair)** සම්මානය හිමිවිය. මෙම චිත්‍රපටයෙන් පසුව ඔහු ඉන්දියාව තුළ පමණක් නොව ලෝකයේම බාල, මහලු, තරුණ සැමගේම ආදරණීය වීරයා වීම කාටවත් ප්‍රතික්ෂේප කළ හැක්කක් නොවීය.

ඔහුගේ නම ලෝකයේම ප්‍රචලිත වීමට බලපෑ චිත්‍රපට රාශියක් අතරින් කීපයක් නම්, ඩාර් (1993), කුච් කුච් හෝතාහේ (1998) ඕම් ශාන්ති ඕම් (2007), වීර්සාරා (2004), මයිනේම් ඊස් ඛාන් (2010), ඩොන් 2 (2011)

අද වනවිට ලෝකයේ සුප්‍රසිද්ධ හින්දි නළුවා කවුද යන්න විමසුව හොත් මුස්ලිම් ජාතියකයකුට දාව ඉපදුන ශාරුක් ඛාන් බව සෑම අයකුම පවසනවා නොඅනුමානය. ඛාන් රඟපෑමට අමතරව 2000 වසරේ දී චිත්‍රපට නිෂ්පාදනයට යොමුවිය. මේ සඳහා ඔහු ආයතන දෙකක් ගොඩනැගීය. එනම්,රෙඩ්චිලීස් **(Red Chillies)** සහ ඩ්‍රීම්ස් අන්ලිමිටඩ් **(Dreams Unlimited)**, යන එම ආයතන දෙකයි. මෙම ආයතන දෙක හරහා අශෝක්, ඕම් ශාන්ති ඕම් වැනි චිත්‍රපට නිපදවීය.

ඔහු මීට අමතරව රූපවාහිනී නාලිකා වල සහ ප්‍රසංග වේදිකාවල ප්‍රධාන නිවේදක ලෙසද තම වෘත්තීමය බාවය පුළුල් කර ගෙන සිටී.

ඔහුගේ අධ්‍යාපනයට සමගාමීව ඔහු තමන්ගේ නිසඟ හැකියාවන් විවිධ පැතිකඩයන් ඔස්සේ ඉදිරියට ගෙනගොස් ඇත.

මේ වනවිට හින්දි සිනමාවට කළ මෙහෙවර වෙනුවෙන් ෆිල්ම් ෆෙයාර් සම්මාන 14 කින් පිදුම් ලබා ඇත. ඉන් විශිෂ්ඨතම රංගනයට සම්මාන 8 ක් හිමි වී ඇත. මෙවන් සම්මාන ප්‍රමාණයක් ඉන්දියාවේ මේ වනතෙක් කිසිම නලුවෙකු හෝ නිලියක හිමිකර ගෙන නොමැති වීමද විශේෂත්වයකි. මොහුගේ අතිදක්ෂතාවය කැපවීම හා නිහතමානීකම ගැන ලෝකයම ඔහුට ගෞරවකරයි. එසේම 2005 වසරේ ඉන්දීය රජය විසින් ඔහු සිනමා නලුවකු ලෙස රටට කළ සේවය අගය කිරීමට,පද්ම ශ්‍රී, සම්මානයෙන් ඔහු පුදන ලදී. මීට අමතර **IIFA** සම්මාන 4 ක් ද හිමිකර ගැනීමට ඔහු සමත්විය.

මේ අන්දමින් බලන කල ශාරුක් ඉතා විශාල ප්‍රමාණයක් බොලිවුඩ් මූවි අවෝඩ්ස්, ග්ලෝබල් ෆිල්ම් අවෝඩ්ස් රැසක් හිමි කරගෙන සිටින වෘත්තීය මට්ටම ඉහළින්ම පවත්වා ගෙන යන ජාත්‍යන්තර මට්ටමේ ආකර්ශනීයම ඉන්දීය නළුවාය.

ශාරුක් ඛාන්ට මෙම ගමන ඒමට ඉතා දරුණු ආර්ථික අපහසුතා සහ අපහාස අවලාද වලට පවා මුහුණ දීමට සිදුවූ බව වරින් වර කරන ලද ඔහුගේම ප්‍රකාශවලින් ලෝකයේ ජනතාව අවබෝධ කර ගෙන ඇත.




ඛාන් විවාහ දිවියට එළඹුනේ 1991 දී තමන්ගේ දිගුකාලීන ආදරවන්තිය සමඟය. අද වන විට පවුල් ජීවිතය අසාර්ථක නොකරගෙන සාර්ථක පවුල් ජීවිතයක් පවත්වා ගෙන යාමට ඛාන් සමත්ව ඇත.






ඛාන් පවුලේ පුතාලා දෙදෙනෙකු සහ එක් දියණියක් සිටී. එසේම ඛාන් පවුල හින්දු සහ ඉස්ලාම් දහම දෙකටම ගරුකර ජීවත්වීම ලෝක සාමයට පවා අතිශය උතුම් ආදර්ශයක් ලබාදේ. ඔහුව අද ඉන්දියාව අමතන්නේ ඛාන් රජ ලෙසයි. **(King Khan)** මෙම නාමය ඔහු දාගත් නමක් නොව ජනතාව විසින් ඔහුට තබන ලද නාමයයි. ඔහු අතිශය නිරහංකාර නිහතමානී සුන්දර මිනිසකු බව කවුරුත් දන්නා කාරණයකි. ඛාන්ගේ ජීවිතය අතිශය කර්කශ දුක්විඳි චරිතයක් නොවුනත් චිත්‍රපට ලෝකයට පවුලේ කිසිදු සම්බන්ධතාවයක් නොමැතිව ඔහු ආගමන් මග විශේෂයෙන්ම ඉස්ලාම් භක්තිකයකු වී මේ ආගමන අතිශය අනභිබවනීය ගමනක් ලෙස අපට දැකිය හැක. එය ඔබටත් මටත් අපගේ ජීවිත ඉලක්ක ලඟාකර ගැනීමට පූර්වාදර්ශ සපයනවා නොවේද...





















ප්‍රේමසිරි ගමගේ
සභාපති, ව්‍යාපාර සංවර්ධන කේන්ද්‍රය.

# "අපේ හීනය සැබෑවක් වුණහැටි...





# මට තවමත් අදහා ගන්න බෑ..."

කරිජ්ජ සුවඳ මුසු මුහුදු සුළඟ ගේ වටා දැවටෙමින් සිට එක්වනම පොල් අතුද උස්සාගෙන ගෙට රිංගන්නට මාන බලන්නේ වන්ඩ බේබද්දෙකුගේ විලාශයෙනි... මේ පාර වාරකන් නම් සැරයි වගේ ලොක්කියේ... කොයිවෙලේ මේ කුණාටුව මේ දිරච්ච වහලෙ උස්සගෙන යාවිද දන්නෑ.. වියා අවසන් කළ පොල් අතු, මැස්සේ අඩුක් කරමින් ශාලිනි දියණියට පැවසුවේ නෝක්කාඩු ස්වරයෙනි... "අප්පා...අපි කවද්ද හොඳ ගේකට යන්නෙ..." මුහුදු රස්සාවට අඩු වැඩියද රැගෙන ගෙයින් එළියට බහින සැමියාගෙන් දියණිය අසනුයේ අද ඊයෙක සිට නොවේ. වටේම පොල් අතු අහුරා වහලයටද පොල් අතු හා ටකරන් හෙවිල්ලන ලද ශාලිනිලාගේ කුඩා පැල්පත දෙස වරක් බැලුවකු නැවත හැරී බලන්නේ එය ඊළඟ මොහොතේ යළි එසේම දැක ගත හැකිවේද යන සැකයෙනි.

"අවුරුදු ගාණක් පුරාම අපි දන්න කියන රාජ්‍ය ආයතන, එන්ජීඕ වගේ තැන්වලට කිව්වා අපිට ඉන්න හිටින්න තැනක් අටවලා දෙන්න කියලා . මට ඉන්නේ පුංචි දරුවෝ තුන්දෙනෙක් ලොකුදුව දෙකේ පංතියේ. මහත්තයගේ මුහුදු රස්සාවෙන්වත්, මම පොල් අතු වියලා හම්බකරන මුදලින්වත් එදා එදා වියදම් පිරිමහ ගන්නවා ඇරෙන්න ගෙයක් දොරක් හදාගන්න මුදලක් ඉතිරිකර ගන්න ලැබෙන්නේනෑ. මම **HNB** ග්‍රාමීන් සමාගමෙන් ණය මුදල් ලබා ගන්නේ දැන් අවුරුදු පහක ඉඳන්. එදා මෙදා කාලය පුරාම අපි ග්‍රාමීන් සමාගමත් එක්ක විශ්වාසවන්තව කටයුතු කළා. මගේ ගේ හදා දෙන්න ග්‍රාමීන් සමාගම තීරණය කළා කියන ආරංචිය දැනගත්තාම මට දැණුනේ අපේ හීනය හැබෑවෙනවා කියන පුදුමයයි.

නන්දකුමාර් ශාලිනිගේ මුවපුරා රැඳී ඇත්තේ අවුරුදු ගාණක් පුරා සැබෑ වෙනතුරු බලා සිටි අරුමැසි සිහිනයක සැබෑව අදහා ගත නොහැකි විශ්මයකි. මම ත්‍රිකුණාමලය ශාඛාවේ ප්‍රකාශ් වෙත හැරුණේ මාසයක් වැනි කෙටි කාලයක් තුළ **HNB** ග්‍රාමීන් කළමනාකාර අධ්‍යක්ෂ ප්‍රධාන විධායක නිළධාරි චමින්ද ප්‍රභාත් මහතාගේ බලාපොරොත්තුව සැබෑවක් කරලන්නට ඔවුන් ගත් වෙහෙස පිළිබඳ විමසන්නටය.

**HNB** ග්‍රාමීන් මෙහෙවර අරමුදල හරහා අපි අසරණ දුප්පත් පවුල්වලට ගෙවල් හදා දෙන්න ගත්තු තීරණයෙ දෙවෙනි කුඩප්‍රාප්තිය තමයි මේ ත්‍රිකුණාමලේ සල්ලි ග්‍රාමයේදී මේ විදිහට සැබෑවක් වෙන්නේ. අනුර උඩවත්ත මහත්තයගේ මෙහෙයවීම මත අපි අසරණ පවුල් කිහිපයක්ම බලලා අවසානයේදී ශාලිනි ව තෝර ගත්තේ ඔවුන් මේ තත්වෙට පත්වෙන්න සාධාරණ හේතු තිබුණු නිසයි. මුළු පවුලෙ ඔක්කෝම එකගොඩේ ජීවත් වුනේ. අඩුම ගානේ මේසයක්වත් ඒ ගෙයි ඇතුලේ තිබුනේනෑ. අපි සැලසුම හදලා ඒ සැලසුමට අනුව අත්තිවාරම් කැපුවෙත් අපේම කට්ටිය. හිතුවා වගේම මාසයක විතර කාලයකින් අපි ගෙයි වැඩ නිමා කළා. ගෙයි පේන්ට් කළේ අපේම ශාඛාවේ නිළධාරීන්. ශ්‍රමය අපි අපිම දරාගත්තු නිසා වියදම් අවමකර ගන්න පුළුවන් වුණා. කාමර දෙකක් සහිත අංග සම්පූර්ණ නිවසක් ඔවුන්ට හිමි වෙද්දී මේ සතුට අනිත් හැමදේටමත් වඩා අපේ සිත් සතුටින් පුරවලා.

2017 දෙසැම්බර් 14 වෙනිදාට හිරු උදාවුණේ ශාලිනිලාගේ ජීවිතවලට මෙතෙක් කිසිදා නොලද සතුටක්ද දෝතින්ම තුරුළු කරගෙනය. පෙ.ව.9.30 එතෙක් ජීවිතයට උදාවුණු හොඳම 9.30 යැයි ශාලිනිගේ ලොකු දුවට සිතුණි. අප්පා...අපි කවදද හරිහමන් ගේකට යන්නේ.. ඉදින් යළි කිසිදිනක ඇය ඇගේ අප්පාගේ සිත කිරි ගස්සන ඒ පැණය නොවිමසනු ඇත. කරිජ්ජ සුවද මුසු සුළං කෝඩ කොතෙකුත් ගෙයි ඉහත්තාවේ අරියාදු කම්පෑවද වහළයේ පොල් අතු පිළිබඳව විද වෙමින් නොනිදා රැය පහන් කරන්නට ශාලිනිට සිදුවන්නේ නැත. කොටින්ම සුළගේ සිහිලස මුළු හිතින්ම විඳ ගත හැකි හෙටක් මෙයින් පසු ඔවුන්ගේ ජීවිත වලට උදාවන්නේය.

මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි
ඡායා - නිර්මාණ ගුණසේකර





* ජීවිතයේ කිසිදා අමතක නොයන ඒ සුබ මොහොත *





* අපේ මහන්සිය තවත් හිසකට සෙවනක් දෙන්නයි *

කාර්යක්ෂමතාවය යනු ද වඩාත් හොඳ ක්‍රමය සොයා ගැනීමයි.




## ජීවිතයට එක්කර ගතයුතු "ආයනු" තුනක්

**ජී**විතයට අළුත් අරමුණු බලාපොරොත්තු එක්කරමින් තවත් අළුත් අවුරුද්දක් උදාවුණා. තමන්ගේ ජීවිතයට වගේම අනෙක් සෑම දේටමත් යහපත් ආරම්භයක් ලබාගැනීම සඳහා වසරක ආරම්භය හොඳ අවස්ථාවක්. ගෙවී ගිය වසර තුළ අප තබා ගත් ඉලක්කයන්ගෙන් සමහරක් ඉටුකර ගන්නට අපට හැකිවීමේ සතුට වගේම අපෙන් ගිලිහී ගිය ඉලක්කයන් පිළිබඳ රිදවීම්ද අප තුළ දරා ගනිමින් අපි මේ අවුරුද්දට පෙරටත් වැඩි ජවයකින් යුතුව මුහුණදිය යුතුයි.

HNB ග්‍රාමීන් සමාගමේ අපට මෙය තවත් එක් රැකියා ස්ථානයක් නෙවෙයි. එය අපේ දෙවෙනි ගෙදරය යන ආකල්පය මේ වනවිට අප සැමගේ සිත් සතන් තුළ රෝපනය වී අවසානයි. මේ ආකල්පය තවදුරටත් වර්ධනය කරලන සංකල්පයක් මේ අවුරුද්දේ ආරම්භයේදී ඔබ තුළ ඇති කරලන්න මම හිතුවා. ඒක **"ආයනු"** තුනක්.

ඔබ රැකියාව කරන මේ ආයතනයට **ආදරය** කරන්න. එය මුළු හිතෙන්ම ආයතනයේ අභිවෘද්ධිය සංවර්ධනය අපේක්ෂාවෙන් කරන්න.

එයට අහිතකර විය හැකි හෝ අවැඩක් වියහැකි කිසිවක් නොකරන්න ආයතනයේ ආරක්ෂකයා අන්කවරෙකුවත් නොව ඔබමයි. ආයතනයේ කුදු මහත් සෑම දේපලක්ම සේම එහි ගෞරවනීය යහපැවැත්ම එනම් HNB ග්‍රාමීන් කීර්ති නාමය **ආරක්ෂාවන** අයුරින් කටයුතු කිරීම සම්බන්ධයෙන් වගකීමක් ඔබට වෙයි.

**ආයතනයේ පැවැත්ම සඳහා ආදායම අත්‍යාවශ්‍යයය.**
ආයතනයේ පැවැත්ම තීරණය වන ප්‍රධාන සාධකයවූ **ආදායම** නංවාලීම සඳහා ඔබට දායක විය හැක්කේ ඉපැයීම් තුළින් පමණක්ම නෙවෙයි. ආයතනයේ සම්පත් උපරිම ඵලදායිතාවක් ලැබෙන අයුරින් අරපරෙස්සමෙන් භාවිතය තුළින්ද ඔබට ඒ සඳහා දායක විය හැකියි. මේ අන්දමට ඔබ ආයතනයට ලබාදෙන **ආදරය ආරක්ෂාව සහ ආදායම** වෙනුවට පෙරලා ආයතනයෙන් ඔබට ලැබෙන්නේ මොනවාද.... ඔබ ආයතනයට ආදරය කරන තරමට ආයතනයද ඔබට ආදරය දක්වනු ඇත.

ඔබ ආයතනය ආරක්ෂා කරන්නේ යම්සේද ආයතනයද ඔබ සහ පවුලේ සියල්ලන්ගේ ආරක්ෂකයා බවට පත්වන්නේ සාමාජීය වශයෙන් මෙන්ම ආර්ථිකමය වශයෙන්ද ආරක්ෂාව සලසමිනි. ආදායම් අතින් ආයතනය ලබන ප්‍රගතිය ඔබගේ ජීවිත සරුසාර කරනු ලබන්නේ එහි අනිවාර්ය ප්‍රතිලාභීන් ඔබ වන බැවිනි. **ඉදින් මේ අලුත් අවුරුද්දේ "ආයනු" තුනේ සංකල්පය තව දුරටත් ඔබ හදවතට සමීපකර ගැනීමෙන් සහ ඒ අනුව කටයුතු කිරීමෙන් සාර්ථකත්වයේ තවත් පියවරක් ඉදිරියට තැබීමට ඔබට හැකිවන බව මගේ විශ්වාසයයි.**

**- චමින්ද ප්‍රභාත් -**
*කළමනාකාර අධ්‍යක්ෂක - ප්‍රධාන විධායක නිළධාරී*

---

**කප්පරක් සිනාවන් - තත්පරෙක නිමේශෙන්**
**ගොළුවෙලා... වියැකිලා... මිළින වී යන අයුර**
**යළි යළිත් පසක් කර**
**ඔබ නික්ම ගොසින් ඇත....**
**පුරා අට වසක් කල් - ග්‍රාමීන් පවුල හා**
**ගෙවූ යුගය නිමාකර ...**
**සොදුරු සිහිවටන දුන් - කඳුළු මතකයක් වී**
**ඔබ නික්ම ගොසින් ඇත...**
**ලක්මාල් ...ඉතින් අපි - නිවන් දොර අතරතුර**
**හමුවේවි යළි භවෙක - එකම එක වරක් හෝ**
**සෙනෙහසින් හිනැහෙන්න...**
**පතා එපැතුම සිතින්**
**සමුගනිමු අපි ඉතින්...**

**දයාබර ලක්මාල්...**
**ඔබට නිවන් සුව**



(අප අතරින් සමුගත් මනෝජ් ලක්මාල් ගමගේ සොයුරා වෙනුවෙනි)

සොවින් තැවෙන...
HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමස්ථ සේවක මණ්ඩලය

---

## ඇතුගල් පුරවරය

ඇතුගල් පුරය වෙත ගණ බුදු රැස් විහිදු
බුදුහිමි වැඩ සිටින සැටි දුටු සිත පැහැදු
සාමය සමාදානය දිවියට සෑදු
මේ පුරවරය රැකදෙන බුදුහිමි සාදු

මිහිපිට සුරලොවක් මෙනි පෙනුමෙන් අපට
අහසේහි සඳමිණක්මෙන් දිස්වෙයි සැමට
කිරි ගරුඩක් මතින් තිබු මැණිකක් ලෙසට
දිස්වෙනවාම හිමිසඳ නෙතු යුග අගට

සොබාදහම නැත හිරිහැරයක් දුන්න
ඉඩ කඩ තියා නැත පුලුවනි සැන සෙන්න
යුධ ගිනි එපා කිසි දිනයක ඇවි ලෙන්න
ඇතුගල් පුරවරය සමිදුනි රැක දෙන්න

- අශෝකා දිවාකර -
දිලිනි දිසානායක (කුරුණෑගල ශාඛාව)

---

## අලුත් වසරක උදාවයි ...

දිනෙන් දින සතිමාස ගතවී තවත් වසරක නිමාවයි
හිරුත් හැඩවී සොදුරු හෙටකට නෙත් අරින්නට වෙලාවයි
නැවුම්වී හද රැදුණු පැතුමන් තුටින් හදවත් පිනායයි
ආයු බොහොවේ තවත් සුන්දර අලුත් වසරක උදාවයි.

කැදුළු දුරහැර සිනා මල්පෙති හැමදනන් මුව රැදෙන්නයි
පතන පැතුමන් සඵලවී දියුණුවේ රන්දොර හැරෙන්නයි
මිනිස් ගුණදම් රැදී හදවත් යහගුනෙන් නිති දිලෙන්නයි
උදාවන නව වසර කාටත් නිරෝගීසැප ලැබෙන්නයි

දෙරන වනසන රුදුරු සංකා කිසිම දා යළි නොවන්නයි
සාමයෙන් සමගියෙන් හදවත් බැදී ලක් මවු රකින්නයි
දිවිමගට යස ඉසුරු ලැබදී සිනට සැනසුම ගෙනෙන්නයි
කිරෙන් පැණියෙන් නැහැවෙනා සුභ අලුත් වසරක් ලබන්නයි

- ඩී.එච්.ඩී. ප්‍රියංවදා ජයමාලි -
මුවගම මධ්‍යස්ථානය - රත්නපුර

---

## මෙහෙවරට ආසිරි

කතුනගෙ ලොවෙහි ගත සිත දාහය නිවන
දල්වා නැණ නුවන් පහන් සෙත්සුව සදන
රන්දොර විවරකරදී ජය මග සදන
මෙහෙවර කප්රුකකි දිවි මග සදනා සෙවන

නවමු දෙයම සැමවිට අප වෙතට පිදූ
''මෙහෙවර''පහන් තරු ආලෝකය විහිදූ
ඔප කර දිවිය සිත්මල් කරදුන් පුබුදූ
"මෙහෙවර" නමට මේ ආසිරි කවි කුමුදූ

- ඩී. ඒ. චාලට් විජයසිරි -
සාමාජිකා - හොරණ ශාඛාව

---

## දිරිය පුතුනි

ප්‍රතිඵල ආ සැණින්උසස්පෙළ
සියළු දෙනා වටකර,
ආ ගිය තොරතුරුත් සමග
සුබ පැතුම් සතර අත
"ඒ" තුනම ගත් ළමයි ළග...
පන්තියේ කෙළවර කදුළු පිරී දෙනෙතක්
හිස් අහස වෙත යොමා,කියා පෑ සිතුවිල්ල
සතුට ළග නොව දුර ඈතකම බවය
ගල් කඩන අම්මාට අත්වැලක් වන්නට
පාඩම් අතපසු වූ බව සැබෑය
ඔත්පලව ඇදට වැටුණු තාත්තට
සරණ වීමට පාඩම් අතපසු වූ බව සැබෑය
"එස්" දෙකක් මිට මොලව ගත් ඔබට
හිමි නොවුවත් විභාගයෙ ජය සතුට
ජිවිත විභාගය ජය ගන්න වෙහෙසෙන
දිරිය පුතුනි... සතුට ඇති හදවත
දුරක නොව ඔබ අසලකම

- ශාමලී පෙරේරා -




අස්වැසිල්ලක් නොමැතිව ඔබේ කාර්යය නිමකරන්න.




# 2017 HNB ග්‍රාමීන් සුහද හමුවෙහි විචිත්‍ර මතක අතර

**HNB** ග්‍රාමීන් සමාගමේ වාර්ෂික සුහද හමුව මෙවර පැවැත්වුණේ 2017.12.08 දින නාවල කොස්වත්තේ ග්‍රෑන්ඩ්සෝලිස් පරිශ්‍රයේදීය. **HNB** ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්හි උප සභාපති බී. ප්‍රේමලාල්, කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත්, අධ්‍යක්ෂිකා ක්‍රිෂාන්ති තම්බයියා **HNB** ග්‍රාමීන්හි හිටපු උපසභාපතිනි සඳමිණි පෙරේරා සහ ප්‍රධාන මෙහෙයුම් නිළධාරී ප්‍රියලාල් අරංගල යන මහත්ම



මහත්මීන්ගේ ගෞරවනීය සහභාගීත්වය ඇතිව පැවැත්වුණු මෙම සුහද හමුව සඳහා ප්‍රධාන කාර්යාලයේ සියළුම සේවක මහත්ම මහත්මීන් සහ ප්‍රාදේශීය කළමනාකරුවන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් සහභාගීවූහ. මෙම සුහද හමුවෙහි රසාලිප්ත බව **HNB** ග්‍රාමීන් සමාගමේ ඒ ඒ අංශයන් මඟින් ඉදිරිපත් කළ විචිත්‍රාංගයන්ගෙන් වඩාත් රසගැන්විණි. එදින සවස සිට මැදියම් රැය ගෙවීයනතෙක් පැවැත්වුණු මෙම සුහද හමුවෙහි විචිත්‍ර මතකයන් රැසක් නිර්මාණ ගුණසේකර, අසංග ගමගේ යන මහත්වරුන්ගේ කැමරා ඇසට හසුවූයේ මෙසේය.

























ඡායා - නිර්මාණ ගුණසේකර
අසංග ගමගේ

# කෘෂිකාර්මික ණය මත පදනම් වූ වෙළෙඳපොළ සමීක්ෂණ.



HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිළධාරි චමින්ද ප්‍රභාත් මහතා සමග කළ සාකච්ඡාවක් ඇසුරිනි.

කෘෂිකාර්මික ණය ලබාදීමේදි එම ණය ලබාදෙන ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයට මුහුණ දීමට සිදුවන ගැටළු සහ අවධානම් තත්වයන් පිළිබඳව මීට පෙර කොටසේදී අපගේ අවධානය යොමු විය. එම ගැටළු සහ අවධානම් අවම කර ගැනීමට ගත හැකි එක් ක්‍රියාමාර්ගයක් වනුයේ අදාල ණය මුදල් නිකුත් කිරීමට පෙර එම වගාවන් සම්බන්ධයෙන් යම් වෙළෙඳපොළ සමීක්ෂණයක් මගින් තොරතුරු ගවේෂණය කර එළඹෙන නිගමනයන් තුළින් අදාල ණය මුදල් නිකුත් කිරීමට පෙළඹීමයි.

වගාවන් වලදී බොහෝ විට ඒ ඒ ප්‍රදේශයන්ට ආවේණිකව වගා කරනු ලබනුයේ එකම බෝග වර්ගයන් වීම පැහැදිලිව හඳුනාගත හැකි තත්වයකි. නිදසුනක් ලෙස වී වගාකරන ප්‍රදේශ ගතහොත් එම ප්‍රදේශයේ ගොවීන් බහුලව වී වගාව ප්‍රධාන වගාව ලෙස වගා කරනු දැකිය හැකිය. එළවළු වර්ගද උඩරට පහතරට වශයෙන් ඒ ඒ ප්‍රදේශ ආශ්‍රිතව බහුලව වගා කරනු ලබන ආවේණික බෝගයන්ට සීමා වනු දැකිය හැකිය. මෙහිදී ඒ ඒ බෝග නිෂ්පාදනයන්ට අදාලව තම ණය ක්‍රම වෙනස් කරගැනීමට ණය ලබාදෙන ආයතන වලට සිදුවේ.

**කෘෂිකාර්මික ණය ලබාදීමේදි අපගේ අවධානය යොමු විය යුතු ප්‍රධාන අංගයන් කිහිපයක් වෙයි.**

- හොඳ අස්වැන්නක් ලබා ගැනීම සඳහා කොපමණ වියදම් කළ යුතුද?
- ණය ලබා දෙනුයේ සත්ව නිෂ්පාදනයක් සඳහා නම් ඒ සඳහා ගතවන කාලය සහ වැය කළ යුතු මුදල කොපමණද?.

මේ තුළින්, ලබා දෙන ණය මුදල නැවත අය කරගැනීමේදී සිදුවිය හැකි අවධානම් පිළිබඳව යම් අවබෝධයක් ලබා ගත හැකිය. ඒ අනුව නිසි කළමනාකාරීත්වයකින් යුතුව අදාල ණය මුදල් ලබා දීමට අදාල ණය දෙන ආයතනයට හැකියාව ලැබේ. මේ අනුව වගාවන් සඳහා ණය ලබා දීමේදී ඊට අදාලව සිදුකරන නිරන්තර සමීක්ෂණයන්ගේ වැදගත්කම අපට අවබෝධ කරගත හැක. එම සමීක්ෂණයේ ප්‍රතිඵල මත අදාල වගාවන් සඳහා අපගේ නව ණය ක්‍රම අතරින් වඩාත් සුදුසු ණය ක්‍රමය භාවිතා කිරීමේ අවස්ථාව ණය දෙන ආයතනයට හිමි වේ.

කෙටි කාලීන හා දිගු කාලීන වශයෙන් ණය වර්ග දෙකක් වන අතර කෙටි කාලීන ණය කෘෂි කාර්මික ණය සඳහා එතරම් යෝග්‍ය වන්නේ නැත. හේතුව කෘෂි කර්මාන්තයේදී වඩාත් වැදගත් වනුයේ දිගු කාලීන ණය බැවිනි. විශේෂයෙන්ම වගාවක් සඳහා අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහා වැඩි ආයෝජනයක් සිදු කළ යුතු හෙයින් දීර්ඝ කාලීන ණය ලබා ගැනීමට ගොවීහු උනන්දු වෙති. මෙහිදී ණය ලබා දෙන ආයතන ගොවීන්ට ණය ලබා දීමේදී දිගු කාලීන ණය ලබා දීමට ප්‍රමුඛතාවයක් ලබා දෙන්නේ නැත. මන්ද යත්, මේ තුළ වන අවධානම හේතුවෙනි. එහෙත් ණය ඉල්ලුම් කරන්නාගේ ස්ථාවරභාවය සහ පසුගිය කාල පරාසය තුළ ඔහු ණය ලබා ගැනීමේදී සහ එම ණය ආපසු ගෙවීමේදී දක්වන ලද ප්‍රගතිය පිළිබඳ දළ විශ්ලේෂණයක් කිරීම තුළින් අදාල ණය මුදල ලබා දීමට ණය ලබා දෙන ආයතනය එකඟ වේ. ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමයේදී අවදානම් දැරීමට සිදුවන ප්‍රධාන දෙයක් නම් ණය ලබා දීම සහ නැවත අයකර ගැනීමයි. මෙය පුද්ගලාගෙන් පුද්ගලයාට ඔවුන්ගේ ආකල්ප හා චර්යාරටාවන් අනුව වෙනස් වන්නකි. එය තීරණය වන්නේ මුදල් ප්‍රවාහයේ ( Cash Flow ) හොඳකම මතය. මේ නිසා ඇතැම් ගොවීන්ට ණය නැවත ගෙවීම සඳහා සහන කාලයක් ලබා දීමට පවා ඇතැම් ණය දෙන ආයතන පෙළඹේ.

**ණය මුදලක් ලබා දීම සඳහා වැදගත් වන තොරතුරු කිහිපයකි.**

- ණය මුදල අවශ්‍ය වන කාරණාව.
- ඒ සඳහා අවශ්‍ය වන ණය මුදල.
- භාවිතා කරනු ලබන කෘෂි කාර්මික ක්‍රමවේද.
- වගා කරනු ලබන බෝගයන්ට අනුබද්ධව දැරීමට සිදුවන අවධානම.

ණය ඉල්ලුම්කරුගේ ණය චක්‍රය සහ ඔහුගේ හැකියාවන් පිළිබඳ නිවැරදි තක්සේරුවකින් පසු ණය ලබා දීම සිදු කළ යුතුය. ණය මුදල් ලබා දීමේදී වෙළෙඳ පොළ තත්වයන් පිළිබඳව මනා දැනුවත් භාවයකින් යුතු වීමද මෙහිදී ඉතා වැදගත්ය. ලැබෙන අස්වැන්න පිළිබඳව මූලික උපකල්පනයන්ගෙන් පසුව එම අස්වැන්නේ වෙළෙඳ පොළ තක්සේරුව පිළිබඳව අපට අවබෝධයක් ලබා ගත හැකිය. ණය ලබා දීමේදී ණය නැවත අය කර ගැනීම සඳහා මෙම දත්ත ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයට ඉතා වැදගත්ය.

**මූල්‍ය වටිනාකම් දාමය**
(Value Chain Finance)

කෘෂි කාර්මික ණය ලබා දෙන ක්‍රමවේදයන් අතුරින් මූල්‍ය වටිනාකම් දාමය නම් වූ ක්‍රමවේදයට හිමිවනුයේ විශේෂ ස්ථානයකි. මෙම ක්‍රමවේදයේදී ණය ඉල්ලුම්කරු සහ ණය ලබා දෙන ආයතනය වශයෙන් අභ්‍යන්තර හා බාහිර යන අංශ දෙකක් යටතේ විග්‍රහ කරනු ලබයි.

## 1) අභ්‍යන්තර මූල්‍ය වටිනාකම් දාමය (Internal Value Chain Finance)

මෙම ක්‍රමවේදයේදී තමාට ලැබෙන අනාගත ප්‍රතිලාභය මත පදනම්ව සෘජුව පාර්ශව දෙකක් අතර සිදුවන ගනු දෙනුවක් යන්න අදහස් වේ. නිදසුනක් ලෙස ගතහොත් ගොවියෙකු විසින් වගාවෙන් ලද අස්වැන්නෙන් කොටසක් හිලව්වට තබා යම් මුදල් ණයට දෙන්නෙකුගෙන් යම් මුදල් ප්‍රමාණයක් ණයට ගැනීම.
පළතුරු වගා කරන ගොවියෙකුට පළතුරු ආශ්‍රිත නිෂ්පාදන කරනු ලබන ආයතනයක් විසින් යම් එකඟතාවයක් මත ලබා දෙනු ලබන ණය. මෙහිදී වගාවේ අස්වැන්න සඳහා අත්තිකාරම් මුදලක් වශයෙන් මෙම ණය ලබාදීමට පළතුරු ආශ්‍රිත නිෂ්පාදන කරනු ලබන ආයතනය පෙළඹිය හැකිය.

## 2) බාහිර මූල්‍ය වටිනාකම් දාමය (External Value Chain Finance)

මෙහිදී ණය ලබා දෙන ආයතනය හෝ පුද්ගලයා මෙම ගනු දෙනුවට මැදිහත් වන්නේ තමන් ලබා දෙන ණය නැවත අය කරගැනීමට හැකි එකඟතාවයක් ඇපයක් ලෙස තබා ගෙනය. නිදසුනක් ලෙස කිසියම් එළවළු වගාකරුවෙකුගේ අස්වැන්න මිලදී ගැනීම සඳහා එළවළු ආශ්‍රිත නිෂ්පාදන කරනු ලබන ආයතනයක් ගොවියා සමඟ ගිවිසුමකට එළැඹ ඇත්නම් එම ගිවිසුම මත පදනම්ව ගොවියාට ණය ලබා දෙන්නට එම ක්ෂුද්‍ර මූල්‍ය ආයතනය හෝ බැංකුව පෙළඹේ. මෙහිදී අදාල ණය ලබා දෙන ආයතනයට අවම අවධානමක් දැරීමට සිදුවීමේ වාසිය ඉතා වැදගත්ය.







# මිනිසුන්ගේ දුක හඳුනන අය වෙන්න කියලයි. එයා දරුවන්ට නිතරම කියන්නෙ

**වාද්දුව මහින්දාරාමය විහාරස්ථානය ඉදිරිපිටට වන්නට පාරෙන් එහා පැත්තේ වූයේ කතෝලික බැතිමතෙකුගේ නිවසකි. පන්සලේ පිරිත් හඬත් - පල්ලියේ ගීතිකා හඬත් හොඳින් හුරුපුරුදු මේ බැතිමතා බයිබලය සේම ධම්ම පදයද හොඳින් ඇසුරු කරන්නෙකි. හිරු ක්ෂිතිජ ඉමෙන් ගිලෙන්නට හෝරා දෙකතුනක් තිබුණද අවට පරිසරය අඳුරු පැහැ ගැන්වී තිබුණේ අහස වැහි වළාකුලින් බරවී වැස්සකට අර අඳිමින් සිටි නිසාය. වැහි බිංදු එක දෙක මහ පොළව සිපගනිද්දී අපි ඔහුගේ නිවසට සේන්දු වුණෙමු. වීරහැන්නදිගේ බර්ට් ඇනස්ලි ප්‍රනාන්දු. ඒ ඔහුගේ නමය. HNB ග්‍රාමීන් සමාගමේ කාගේත්, ඇනස්ලි සර්, වූ ඔහු HNB ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්හි පළමු සේවක අංකයට හිමිකම් කියන්නේ මෙහි පැරණිම කාර්යමණ්ඩල සාමාජිකයාට සේම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-වරයාට හිමි ගෞරවනීයත්වයද නිසගයෙන්ම හිමිකර ගනිමිනි.**

පොල්, කොස්, දෙල් ආදී ගසින් හෙවුණු වත්තක මැදට වන්නට පිහිටි ඔහුගේ නිවස



අබියසට අප යන විටම සුපුරුදු ලෙන්ගතු සිනාවෙන් මුව සරසාගත් ඇනස්ලි සර් ප්‍රිය බිරිඳත් සමඟ අප පිළිගත්තේ සාද සාම්ච්චියකට සුදුසු වට පිටාවකට ඉඩහසර සලසමිනි.

ජී. ශාමලී මනෝහාරී පෙරේරා..., දෙහිවල ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේ නියෝජ්‍ය විදුහල්පතිනියකවූ ඇය ඇනස්ලි මහතාගේ ප්‍රිය බිරිඳය., අපේ ගෙදර, සාද සාම්ච්චියට මුල පුරමින් ඇය සිය හඬ අවදි කළේ මෙසේය.

''මගේ ගම මොරටුව කඩොලාන - මොරටුවේ වේල්ස් කුමරි විද්‍යාලයෙන් උසස් පෙළ වෙනකම් ඉගෙනගෙන ඉන්පස්සෙ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලබාගත්තා. ඒ 1987 දී විතර. 1990 දී තමයි මුලින් ම ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයට උප ගුරුවරියක් විදිහට පත්වීම ලැබුවේ. එදා ඉඳන් අද වෙනකම් විවිධ තනතුරු උසුලමින් මගේ වෘත්තීය කටයුතු ඉතාම සතුටින් කර ගෙනයනවා.''

**මොරටුවේ හිටපු ඔබට වාද්දුවේ හිටපු ඇනස්ලි තරුණයාව මුණ ගැහෙන්නේ කොහොමද...**

''ඔවුන්ගේ කැදැල්ල..''බිහි වීමට මූලාරම්භය සැකසූ ඒ අහම්බය පිළිබඳව ඇය පැවසුවේ මෙහෙම කතාවක්.

''මගේ නංගිගේ යාළුවෙක් හිටියා සිසිර කියලා - නංගි සිසිරට කියලා තිබුණා. අපේ අක්කට කෙනෙක් හොයනවා...හොඳ කෙනෙක් ඉන්නවානම් බලන්න කියලා. සිසිර ඇනස්ලිගෙ යාළුවෙක්. සිසිරගෙ මාර්ගයෙන් තමයි ඇනස්ලි අපේ ගෙදරට ඇවිත් අම්මා තාත්තා එක්ක කතා කළේ. මෙයාව දැක්ක ගමන් මට හොඳයි කියලා හිතුණා. ඒත් එක පාරටම කැමැත්ත දුන්නේනෑ.

''මෙයාගෙ නංගි සිසිරට කියලා තිබුණෙ බොන්නෙ නැති අයට තමයි අක්කා කැමති කියලා. ඒ කාලෙත් මම හොඳට බොනවා... වැඩේ මාට්ටු වෙන්න කලින් වැඩි කල් නොයවාම අපි බැන්දා...'' ඇනස්ලි මහතා සිය සුපුරුදු සිනාවෙන්ම ඒ ඌන පූර්ණය කළේ ඒ සොඳුරු අතීතය හා බැඳී තව බොහෝ සිදුවීම් කතා බහට එක් කරමිනි.

ශ්‍යාමලී, ඇනස්ලි යුවලගේ සොඳුරු කැදැල්ල වර්ණවත් කරමින් අර්ෂණා සෙනාලි ප්‍රනාන්දු (20) සහ ෂෙනුලි අමන්දා ප්‍රනාන්දු (17) දියණියන් එකතු වන්නේ මේදෙමහල්ලන්ට මව්පිය ධූරාවලියේ වගකීම් බෙදා දෙමිනි.

''ඇනස්ලිට හැමදේම පිළිවෙලට ඕන. එයා ලයිට් බිලේ ඉඳලා ෆයිල් කරලා තියෙනවා. මම ළමයි දහස් ගාණක් ඉගෙන ගන්න විදුහලක නියෝජ්‍ය විදුහල්පති වුණත් මට වඩා හොඳට මගේ දුවලා දෙන්නා කීකරු ඇනස්ලිට. එයා තමයි දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට මට වඩා උනන්දු. ඉස්කෝලෙ නිවාඩු කාලෙට දරුවො දෙන්නත් එක්කගෙන රට පුරා ඇවිදින්න ඇනස්ලි හරි ආසයි. අපිට ඉන්නෙ දුවලා දෙන්නෙක් වුණාට කොල්ලො දෙන්නෙක් වගේ ඕනම අභියෝගයකට මුහුණ දෙන්න පුළුවන් විදිහට දරුවො දෙන්නා හදන්නයි එයාට ඕන වුණේ. ''පුතේ හැමතිස්සෙම පොළවෙ පය ගහල ජීවත් වෙන්න පුරුදු වෙන්න''කියලා එයා දුවලා දෙන්නට නිතර කියනවා. අපිට වාහනයක් තිබුණත් දරුවන්ව එයාලගේ ක්ලාස්වලට යවන්නේ බස්එකේ. මිනිස්සුත් එක්ක ගැටෙන්න ඔවුන්ගේ දුක හඳුනා ගන්න පුළුවන් විදිහට ළමයි හැදෙන්න ඕන කියලයි ඇනස්ලි නිතරම කියන්නේ. අද සමහර ළමයින්ට ෆෝන් එකයි කොම්පියුටර් එකයි ඇරෙන්න වෙන ලෝකයක් නෑ. තමන්ගේ නෑදෑයින්ව හඳුනන්නේ නෑ. අහළ පහල කෙනෙක් හඳුනන්නේ නෑ. අපේ ගෙදරට කවුරු ආවත් ඇනස්ලි දරුවන්ට ඒ අයව හඳුන්වලා දෙනවා. දරුවන් පවුල තුළ හුදකලා වෙන්න හොඳ නෑ කියලයි ඇනස්ලි නිතරම කියන්නේ. අපේ ළමයිනුත් යන්නෙ එයාගේ අඩිපාරේ.''



**ඔබගේ ජීවිතය හා බැඳුණු සමීපතමයා ලෙස ඇනස්ලි ප්‍රනාන්දු කියන චරිතය ඔබ විග්‍රහ කරන්නේ කොහොමද.**

''ඇත්තටම ඔහු හොඳ සැමියෙක්. දරුවන්ට හොඳ පියෙක්. එයා වැඩ ඇරිලා ගෙදර එද්දිම මට කියන්න පුළුවන් එයාගේ මූඩ් එක කොහොමද කියලා එයා අහන සිංදුවලින්, හැසිරෙන විදිහෙන්. එදා ඔෆිස් එකේ මොකක්හරි ප්‍රශ්නයක් වෙලාද නැත්නම් මොකක්හරි කළකිරීමකින් ද ඉන්නෙ කියලා මට කියන්න පුළුවන්. ඇනස්ලි කැමති හුගක් සැහැල්ලුවෙන් විනෝදෙන් ජීවත්වෙන්න. අපේ ගෙදර සුන්දර තැනක් කරන්න ඇනස්ලි නිතරම උනන්දු වෙනවා.

**රාත්‍රිය එළඹෙන්නට හෝරාවකට වඩා නැත. ඝන දුරට දිගෑදෙන්නට ඉඩදී හිරු තම රැස් වළලු හකුළා ගනිමින් අවර දිගින් නොපෙනී යමින් හිඳී. ආදරය දයාබර බව සේම පරමාදර්ශී බවද කැටිකරගත් මේ සොඳුරු කැදැල්ලෙන් අප සමුගත යුතු වේලාව එළඹෙමින් තිබේ!■**

සටහන - මංජුල ප්‍රභාත්
සේයා රූ - ඩිශාන් සමින්ද








HNB ග්‍රාමීන් වේගවත්ම තරුණයා - ඉස්මත් -



හොඳම පන්දු යවන්නා - ඉෂාර -



හොඳම පන්දුරකින්නා - ඉස්මත් -



හොඳම පිතිහරඹය - සුරම්‍යගෙන් -


පළඟ ශූරතාව ශාඛා ජ

එච්.එන්.බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්හි ක්‍රීඩා සංගමය මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන HNB ග්‍රාමීන් ශූරයින්ගේ කුසලාන මහා ක්‍රිකට් තරගාවලියෙහි අවසාන මහා තරගය පසුගිය ජනවාරි 06 වන දින කොළඹ 07 බ්ලූම් ෆීල්ඩ් ක්‍රීඩාංගනයේදී දවස පුරා අති උත්කර්ෂවත් ලෙස පවත්වනු ලැබුවා. ප්‍රාදේශීය මට්ටමින් තේරුණු ජයග්‍රාහී ක්‍රිකට් කණ්ඩායම් 16 ක් සහ ප්‍රධාන කාර්යාලයේ ජයග්‍රාහී කණ්ඩායම් හතරක් තරඟ වැදුණු මෙම තරගාවලියේ ජයග්‍රාහී කණ්ඩායමට හිමි HNB ග්‍රාමීන් ශූරයින්ගේ කුසලානය HNB ග්‍රාමීන් අම්පාර ශාඛාව විසින් දිනා ගනු ලැබූ අතර අනුශූරතාව HNB ග්‍රාමීන් පුත්තලම ශාඛාව විසින් දිනාගනු ලැබුවා.

ක්‍රිකට් තරගාවලියට අමතරව මීටර් සියය දිවීමේ කාන්තා හා පිරිමි තරගයද, එච් එන් බී ග්‍රාමීන් කුමරා තරගයද මෙවර තරගාවලියේ ආකර්ශනීය බව තීව්‍ර කිරීමට හේතු වුණා.

තරගාවලියේ උත්කර්ෂවත්ම මොහොත වූ ත්‍යාග හා කුසලාන පිරිනැමීමේ අවස්ථාවට එච්.එන්.බී ග්‍රාමීන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ප්‍රධාන විධායක නිළධාරී චමින්ද ප්‍රභාත් මහතා, මෙහෙයුම් නිළධාරී ප්‍රියලාල් අරංගල මහතා සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් වන ඇනස්ලි ප්‍රනාන්දු, රුවන් ප්‍රනාන්දු, බිමල් සෙනෙවිරත්න, ආර්.එම්.පී. දයාවංශ යන මහත්වරු සහභාගී වුණා.

# HNB


ගම්පහ ශාඛා කණ්ඩායම


තිස්ස සේවා ම




ගලෙන් බිඳුනුවැව සේවා මධ්‍යස්ථාන කණ්ඩායම


අම්පාර ශාඛා කණ්ඩායම





ත්‍රිකුණාමලය ශාඛා කණ්ඩායම


ගාල්ල ශාඛා කණ්ඩායම







රත්නපුර ශාඛා කණ්ඩායම


ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය අංශ කණ්ඩායම


මල්



තරගයේ ශූරයෝ අම්පාර ශාඛා කණ්ඩායම




ණ්ඩායමට


තරගයේ අනුශූරතාවය - පුත්තලම ශාඛාවට -


පළඟ ශූරතාව තරගයේ වීරයා - චාමර -


HNB ග්‍රාමීන් වේගවත්ම තරුණිය - අමල්කා -


පළඟ ශූරතාව අනුශූරතාව - රත්නපුර ප්‍රාදේශිකය -

# ග්‍රාමීන් ශූරයින්ගේ කුසලානය මෙවර අම්පාර ශාඛාවට


ථාන කණ්ඩායම


ප්‍රධාන කාර්යාලයේ අළෙවි අංශ කණ්ඩායම


ජා-ඇල ශාඛා කණ්ඩායම


පුත්තලම ශාඛා කණ්ඩායම


නගර ශාඛා ශාඛා කණ්ඩායම


කළුතර ශාඛා කණ්ඩායම


නිකවැරටිය ශාඛා කණ්ඩායම


ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය අංශ කණ්ඩායම


වැලිමඩ ශාඛා කණ්ඩායම


සේවා මධ්‍යස්ථාන කණ්ඩායම


දඹුල්ල ශාඛා කණ්ඩායම


කෑගල්ල ශාඛා කණ්ඩායම

නම්‍යශීලී පුද්ගලයෙකු වීම ජීවන පැවැත්මට වඩා මහෝපකාරීවේ.



තුන්රුවනේ ආශිර්වාදය පතා




පියතුමන් නව වසර ආසිරි ගැන්වූ මොහොත



2018 නව වසරේ ජනවාරි 02 දා HNB ග්‍රාමීන් ෆිනෑන්ස් සමාගම තම වැඩකටයුතු ආරම්භ කළේ කවදත් සුපුරුදු විදිහට සර්ව ආගමික වතාවත්වලට මුල් තැනක් දෙමින්. ආගමික වතාවත් වලින් පසුව සියළු රස මසවුලෙන් සැදුම් ලත් තේ මේසයේ රසය විඳගත් HNB ග්‍රාමීන් ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය පසුගිය වසරේ ලද ජයග්‍රාහන තුළින් හා ලද අත්දැකීම් තුළින් 2018 නව වසරට වඩාත් ශක්තිමත්ව හා සාර්ථකව මුහුණ දීමට මේ සැම දෙනෙකුගේම සිත්තුළ දැල්වෙමින් තිබුණේ නොනිවෙන අදිටනක්.






වාසනාවන්ත සුබ නව වසරක්....!



## ග්‍රාමීන් දෑත හොත

වසරක අවසානය සනිටුහන් කරන්නේ තවත් වසරක ඇරඹුම. වසරක් ගෙවී යද්දී එළඹෙන නව වසර වෙනුවෙන් වගේම ගෙවීගිය වසරේ ලද අත්දැකීමුත් සිහිපත් කරලා සමාජයේ යහපැවැත්ම වෙනුවෙන් තමන්ගෙන් වියයුතු සමාජමය යුතුකමක් වෙනුවෙන් සිත යොමු කරන්න අපි හුග දෙනෙක් අමතක කරන්නේ නෑ. **HNB** ග්‍රාමීන් පුත්තලම ශාඛාවේ සහෝදර සේවක පිරිස සිය වැටුපෙන් කොටසක් පරිත්‍යාග කරමින් 2017 / දෙසැම්බර් 21 දින පුත්තලම ප්‍රදේශයේ අඩු ආදායම්ලාභි ජනතාවක් ජීවත්වන ගම්මානයක් වන සීමාවේලි ගමෙහි දූ දරුවන් 30 දෙනකු සඳහා නව වසර වෙනුවෙන් පාසල් අභ්‍යාස පොත් කට්ටල බෙදා දීමේ වැඩසටහනක් සුදානම්කරන ලද්දේ මේ සමාජමය යුතුකමේම කොටසක් විදිහටයි.





## මිතුරු ගුණ සුවඳ සමරා....





පුත්තලම ශාඛාවේ සේවයේ නියුතුව සිටියදී, මෙයට වසරකට ඉහතදි හදිසි අනතුරකින් මිය ගිය චාමල් ඉෂාර සොයුරා සිහිපත් කරලා ඒ වෙනුවෙන් දානමය පුණ්‍යකර්මයක යෙදෙන්න පුත්තලම ශාඛාවේ අපේ සගයො අමතක කළේ නෑ. හුරු පුරුදු ලෙන්ගතුකම් හදවතේ මතකයකට පමණක් සීමා නොකර පසුගිය 2017 දෙසැම්බර් 30 දින පුත්තලම ශාලොම් ළමා නිවාසයේ ළමුන් පහලොස් දෙනකුන් සඳහා අතුරු පස සහිත දිවාආහාර වේලක් පිරිනැමීමට ඔවුන් කටයුතු කළේ සිය ආදරණීය මිතුරාට යළිත් මෙවන් අකල් මරණයක් අත්නොවේවා යන ප්‍රාර්ථනයද සිත්හි දරාගෙනයි.



**HNB** ග්‍රාමීන් සමාගමේ ගාල්ල ශාඛාව සිය කාර්ය මණ්ඩලයේ මූල්‍ය පරිත්‍යාගයෙන් පසුගිය දෙසැම්බර් දහවෙනිදා තවත් සොදුරු මෙහෙවරකට අතගැහුවා. ඒ ගාල්ලෙ කිතුලම්පිටිය ප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් හැටදෙනකුන් උදෙසා පාසැල් පොත් හා උපකරණ බෙදාදීමේ අවස්ථාවක් සංවිධානය කරමින්. කිතුලම්පිටිය ශාන්ත ෆ්‍රැන්සිස් දෙව්මැදුරේදී ගාල්ල ශාඛාවේ නිළධාරී මඩුල්ලේ සහභාගීත්වයෙන් මෙම පාසැල් උපකරණ බෙදාදීම සිදු කෙරුණා.



රාජකාරි නිසි ලෙස කල යුත්තේ බිය නිසා නොව එය තම යුතුකම ලෙස සලකාය.









## ඔබ (NO) දන්න මම

### - ඩිලාන් දිල්රුක් තමෙල් -
### ප්‍රාදේශීය කළමනාකරු ,පුත්තලම ප්‍රාදේශිකය

- **සම්පූර්න නම :-** වර්ණකුල සූරිය ඩිලාන් නිලූප දිල්රුක් තමෙල්
- **උපන් දිනය (කැමති නම්) :-** 1981-07-15
- **ඔබේ ළමා කාලය ගතවුණු අන්දම:-** මගේ උපන් ගම තඹරවිල - වයික්කාලෙ ටවුන් එකෙන් හැරිලා යන්න ඕන. අපේ ගෙවල් තිබුණෙ වයික්කාල ටවුන් එකට කිට්ටුවම නිසා මගේ ළමා කාලය ගෙවුනේ නාගරික පරිසරයක් එක්ක කිව්වොත් වඩාත් හරි. අපේ තාත්තාට උළු මෝලක් තිබුණා. අම්මා රස්සාවක් කළේ නෑ. ගැහැණු දරුවො දෙන්නෙක් සහ එක පිරිමි දරුවෙක් ඉන්න පවුලක වැඩිමහල් පිරිමි දරුවාට හිමි වෙන්න ඕන හැම වරප්‍රසාදයක්ම මට ලැබුණා. ඒ වගේම නිදහස උපරිමයෙන් ලැබුණු බොහොම කෙළිලොල් ළමා කාලයක් මට තිබුණා.
- **පාසැල් කාලයේ ඔබේ ප්‍රියතම පාසැල :-** මම ඉස්කෝල දෙකකට ගියා - පුංචි කාලෙ ඉදන් සාමාන්‍ය පෙළට වෙනකම් මම ගියේ තඹරවිල ප්‍රාථමික විද්‍යාලයට. අපේ ගෙදර ඉදන් පයින් යන්න පුළුවන් දුරක ඉස්කෝලෙ තිබුණෙ. උදේට වෙලාවට ඉස්කෝලෙ ගියත් ඉස්කෝලෙ ඇරිලා කවදාවත් වෙලාවට ගෙදර එන්න පුරුද්දක් අපිට තිබුණෙ නෑ. ඉස්කෝලෙ ඉදන් ගෙදර එන පාරෙ හැම පොල් වත්තක්ම පළතුරු ගහක්ම අපිට සින්නක්කරේට ලියලා දීලා කියලා තමයි අපිට හිතුනේ. වතුවලට පැනලා කුරුම්බා බීලා ගඩාගෙඩි කාලා ගෙදර එනකොට සමහරක් දාට හතර පහ පහුවෙලා. එහෙම දවස්වලට වගේම අපිටත් කලින් අපි ගැන පැමිණිලි ගෙදරට ඇවිත් තිබුණු දවස්වලට තාත්තාගෙන් මදිනොකියන්න කන්න ලැබුණු අවස්ථාත් ඕන තරම්. උසස් පෙළ කරන්න මාරවිල ශාන්ත සේරියල් විද්‍යාලයට මට යන්න සිද්ධ වුණා. මේ ඉස්කෝල දෙකෙන් ගමේ පුංචි ඉස්කෝලෙට මම වඩාත් කැමතියි. ඒ මගේ ළමා කාලයේ බොහොම සුන්දර මතක ගොන්නක් ඒ ඉස්කෝලෙත් එක්ක බැදිලා තියෙන නිසා වෙන්න ඇති.
- **විෂය :-** හේතුවක් දන්නේ නෑ. පුංචි කාලෙ ඉදලා මම ගණිතය විෂයට වැඩි කැමැත්තක් දැක්වූවා.
- **ක්‍රීඩාව :-** ක්‍රීඩාවල් අතරින් ෆුට්බෝල් ක්‍රීඩාවට මම වඩාත් කැමතියි. ඉස්කෝලෙ ෆුට්බෝල් කණ්ඩායමේ මම නොහිටියට අපේ ගමේ ක්‍රීඩා සමාජයට මම සෙල්ලම් කළා.
- **පාසැල් කාලයේදී ලොකු වුණාම වෙන්න හිතන් හිටියේ :-** ලොකු වුණාම මම මේ වගේ පුද්ගලයෙක් වෙනවා කියලා ඉලක්කයක් හෝ අරමුණක් කවදාවත් මට තිබුණේ නෑ. සමහර විට අපේ ගෙවල් වල තිබුණ පරිසරය නිසා වෙන්න ඇති. එහෙම ලොකුවට අනාගතයක් ගැන බලාපොරොත්තුවක් මට නොතිබුනේ.
- **මුල්ම රැකියාව සහ වඩාත්ම ආශාවෙන් කළ රැකියාව :-** 2000 අවුරුද්දේ අ.පො.ස. (උ/පෙළ)විභාගයට පෙනී හිටලා මුලින්ම වයින් ස්ටෝර්ස් එකක වැඩ කළා. ඒක නෑදෑ කෙනෙක්ගෙ එකක් නිසා ඒ සම්බන්ධතාවය උඩ තමයි ඒකෙ වැඩට ගියේ. අවුරුදු 1 1/2 ක් විතර මම ඒක බලාගෙන හිටියා. අන්තිමේදී පොඩි ප්‍රශ්නයක් වෙලා මම එතැනින් අයින් වෙලා තාත්තාගේ උළු මෝල බලාගෙන තාත්තාට උදව් කරගෙන හිටියා. 2004 ජනවාරි වල මම ග්‍රාමීන් සමාගමට සම්බන්ධ වුණා. එදා ඉදන් මේ වෙනකම් මගේ ජීවිතේ ගෙවුනේ ග්‍රාමීන් සමාගමත් එක්ක. ජීවිතේට මේ හැම වටිනාකමක්ම ලැබුනේ ග්‍රාමීන් සමාගම නිසාය කියන එක අමතක කරන්න බෑ.
- **ජීවිතේ අමතක නොවන සිද්ධිය :-** 2009 මගේ තාත්තාගෙ මියයාම සහ 2016 දෙසැම්බර් 13 වෙනිදා දුවගෙ මියයාම. මේ මරණ දෙකම මගේ ජීවිතය අතිශය කම්පනයට පත්කළ සිද්ධීන්.
- **ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණු දිනය සහ දුකට පත්වුණු දිනය:-** ජීවිතේ වඩාත්ම සතුටට පත්වුණේ මම විවාහ වුණ දවසෙ. වඩාත්ම දුකට පත්වුණේ මගේ දුව මිය ගිය දවසෙ.
- **අතීතයට යාමට වරමක් ලැබුනොත් ඔබ තෝරාගන්නා ජීවිතේ හොඳම කාලය සහ ඊට හේතුව :-** දුව ඉපදුණු දවසෙ ඉදලා අපිත් එක්ක ජීවත් වුණු කාලය. මට ඒ අතීතයට ආපහු යන්න ලැබුණොත් දුවව ඒ මරණයෙන් බේරගන්න මට පුළුවන් වේවි කියලා මම හිතනවා.
- **ජීවිතයට අහිමි වුණු වටිනාම පුද්ගලයා හෝ අවස්ථාව :-** තාත්තා. අපේ තාත්තා වචනයක් කිව්වොත් ආයිත් ඒක කවදාවත් මොනම හේතුවකටවත් වෙනස් කරපු පුද්ගලයෙක් නෙවෙයි. එයා කවදාවත් සල්ලි කොලයක් නවනවා මම දැකලා නෑ. ඉස්සර දැන් වගේ අයන් නොතිබුණු කාලයක තාත්තා පුරුදු වෙලා හිටියෙ ෂර්ට් එකයි සරමයි නවලා රෑට කොට්ටේ යට තියාගෙන නිදියන්න. පස්සෙන් පහු කාලෙදිත් ඒ පුරුද්ද තාත්තා අතහැරියෙ නෑ. හරි කෙලින් නීටි එකට වැඩ කරන පුරුද්දක් තාත්තාට තිබුණා. හැබැයි ඉක්මනට කේන්ති යනවා. තාත්තා මිය යාමත් එක්ක අපිට හුඟක් දේවල් අහිමි වුණා. අදටත් තාත්තා නැති අඩුව අපිට දැනෙනවා.
- **හරි ගස්සා ගන්න අවස්ථාවක් ලැබුනොත් ඔබ වෙනස් කරගන්නා ඔබේ දුර්වලතා :-** තරහා යාම තමයි. හරි ඉක්මනට තරහා යනවා. ඒක පාලනය කර ගන්න කොයිතරම් උත්සාහ ගත්තත් තාම මට ඒක බැරිවෙලා. තාත්තාගෙන් ආපු දෙයක් වෙන්න ඇති.
- **ඔබ හිතන විදිහට ඔබ වඩාත්ම කුසලතාවන් ප්‍රකට කරන්නේ:-** මම හිතන්නේ කළමනාකරුවෙක් විදිහට මම දක්ෂයි කියලා. සමූහයක් පාලනය කරන්න ඔවුන්ව නිසිලෙස හසුරුවන්න පුළුවන් හැකියාවක් මට තියෙනවා.
- **පළමු ආදර අත්දැකීම ජීවිතයට බලපෑ අන්දම :-** එහෙම අත්දැකීමක් ලැබිය හැකි අන්දමේ හැඟීමක් ඇති වෙලා නෑ. මොකද මම කවදාවත් ගැණුළමයෙක් එක්ක යාළුවෙලා නෑ. මම විවාහ වුණේ යෝජනාවකින්. ඇය දනුෂ්කා ජීවන්ති ප්‍රනාන්දු.
- **එම පුද්ගලයාගේ ඔබ දකින සුවිශේෂතාව :-** දනුෂ්කාගේ මම දකින විශේෂ ගුණාංගයක් තමයි එයාගේ දැඩි ආගමික භක්තිය. උදේ හවස එයා පල්ලියට යන එක නම් දවසේ අනිවාර්ය අංගයක්.

**එහෙම දවස්වලටඅපිටත් කලින් අපි ගැන පැමිණිලි ගෙදරට ඇවිත් තිබුණා...**

- **ඔබ ඔබේ ජීවිතය ගැන තෘප්තිමත්ද :-** නැතුව... මම මගේ ජීවිතේ ගැන තෘප්තිමත්.
- **ඔබේ ජීවිතය වෙනස් කළ හැරවුම් ලක්ෂ්‍යය (terning Point):-** ග්‍රාමීන් සමාගමේ සේවයට එන්න මම ගත්තු තීරණය. මේ ආයතනයේ පුංචිම තැනක ඉදලා අද ඉන්න තත්වය කරා පියවරෙන් පියවර ඇවිත් ජීවිතයේ හුඟක් දේවල් ලබන්න ග්‍රාමීන් සමාගම නිසා මට පුළුවන් වුණා.
- **ඔබේ ප්‍රියතම ගායකයා :-** බ්‍රදර් චාල්ස්
- **ගීතය :-** ජේසුනි ඔබ ඉස්සර වෙලා
- **චිත්‍රපටිය :-** Titanic
- **අනාගත ඉලක්කය :-** මේ රැකියාව හොඳින් කරගෙන තව තවත් ඉදිරියට යෑම තමයි.

සාකච්ඡා කළේ -
මංජුල ප්‍රභාත් හෙට්ටිආරච්චි

# "මෙහෙවර" සත්කාර අරමුදලින් පිළිසරණ ලැබූවෝ...

සත්කාර අරමුදලින් පිළිසරණ ලැබූවෝ...

මිනිසුන් අසරණ වන්නේ කොයි මොහොතක කෙසේ දැයි අප කාහටනම් කිවහැකිද...එවන් මොහොතක ඒ අසරණ මිනිසුන් හට කිසියම් හෝ අන්දමකින් සරණ විය හැකිනම්....මෙහෙවර සත්කාර අරමුදල බිහිවන්නේ එවන් උදාර අරමුණක් පෙරදැරිවය.

HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ ඔබගේම ධන පරිත්‍යාගයෙන් ගොඩනැගුණු "මෙහෙවර" සත්කාර අරමුදලේ පිහිට පතමින් දිවයිනේ දසතින් අප වෙත ලැබෙන ඉල්ලීම් සිය ගණනක් අතරින් තෝරාගත් පිළිසරණ අපේක්ෂකයින් කිහිපදෙනෙකුට පසුගියදා අපි ආධාර මුදල් ලෙස ලබාදීමට කටයුතු කළෙමු. එසේ මේ වනවිටත් ආධාර ලබාදී ඇති ආධාර ලාභීන් කිහිප දෙනකු පිළිබඳ තොරතුරු මෙසේය.



01. වැලිමඩ ශාඛාව
සාමාජිකාව:- ඩබ්.ජී. නිලන්ති
ආධාර ලාභියා:- ඩබ්.ඩබ්.එච්. කවිෂ (පුතා)
ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා



02. වැලිමඩ ශාඛාව
සාමාජිකාව:- ආර්.ආර්. ප්‍රියදර්ශනී
ආධාර ලාභියා:- එම්.එම්.ජේ. රන්දිව් (පුතා)
ආධාර ලබාදීමට හේතුව:- වෛද්‍ය ප්‍රතිකාර සඳහා






මුදල් පරිහරණය හා ඉතිරි කිරීම් වර්ධනය කරගැනීම පිළිබඳ සාමාජිකාවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් HNB ග්‍රාමීන් කෑගල්ල ශාඛාවේ සංවිධාන දායකත්වයෙන් 2017.10.13 දින පෙ.ව. 9.00 සිට කෑගල්ල නිපුණ උත්සව ශාලාවේදී පවත්වන ලදි. මේ සඳහා කුරුණෑගල ශාඛාවේ සාමාජිකාවන් 175 දෙනකුන් සහභාගිවූ අතර HNB ග්‍රාමීන් පුහුණු අංශ ප්‍රධානී අනුර උඩවත්ත සහ පුහුණු අංශයේ කළමනාකර නුවන් කුමාර යන මහත්වරුන් විසින් වැඩසටහන මෙහෙයවන ලදි.



2017 වසරේ අ.පො.ස.(සා.පෙල) විභාගයට පෙනී සිටි සිසුදරුවන් වෙනුවෙන් විද්‍යා විෂය සඳහාවූ සම්මන්ත්‍රනයක් පසුගිය වසරේ නොවැම්බර් 27 වෙනි දින නිකවැරටිය මහසෙන් ජාතික පාසලේදී පවත්වනු ලැබූයේ HNB ග්‍රාමීන් පුහුණු අංශයේ සහ නිකවැරටිය ශාඛාවේ සංවිධාන දායකත්වයෙනි. දූ දරුවන් 250 අධික පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන ලද මෙම සම්මන්ත්‍රනය කොළඹ සාන්ත පීතර විද්‍යාලයේ ආචාර්ය ජයන් බණ්ඩාර මහතා විසින් පවත්වන ලදී.

# උසස් පෙළ කඩඉම ජයගත් අපේ හපන්නු

පසුගියදා ප්‍රතිඵල නිකුත් වූ අපොස උසස් පෙළ විභාගයෙන් විශිෂ්ඨ ලෙස ලකුණු ලබා ගනිමින් උසස් පෙළ කඩඉම ජයගැනීමට හෂිණී නයනතාරා පොන්නම්පෙරුම දියණිය සමත්ව සිටි ලකුණු මට්ටම අනුව වාණිජ විෂය ධාරාවෙන් සමස්ථ දිවයිනෙන්ම 13 වන ස්ථානයද දිස්ත්‍රික් මට්ටමින් 4 වන ස්ථානයද දිනා ගැනීමට සමත්වූ හෂිණී අපේ කාර්ය මණ්ඩලයේ ස්ථාවර තැන්පතු අංශයේ කළමනාකාරවරයෙකු වූ අනුරුද්ධ පොන්නම්පෙරුම මහතාගේ දියණියයි.

හෂිණී නයනතාරා පොන්නම්පෙරුම දියණිය ලැබූ මෙම විශිෂ්ඨ ජයග්‍රහනය සම්බන්ධයෙන් HNB ග්‍රාමීන් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ප්‍රධාන විධායක නිළධාරිතුමා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයේ සුභාෂිංසන අපි මෙසේ පිළිගන්වමු.






තමා තමාට නායකයෙකු වියයුතුය.


NB GRAMEEN මෙහෙවර 13
2018 ජනවාරි - පෙබරවාරි

# facebook පිටුවෙන්

ඔබට ඇත්තේ
සීමිත කාලයක්.
වෙනත් කෙනෙකුගේ
ජිවිතය හසුරවමින්
එය අපතේ යවන්න එපා.

ස්ටීව් ජොබ්ස්



ඇත්තටම
අනිත් අය කරන්න බැහැ
කියලා කියන දේවල් කිරීම
තුළින් මට ලැබෙන්නේ
පුදුමාකාර සතුටක්.

වෝල්ට් ඩිස්නි





"බාගෙට ඉඳුණු මිනිස්සුන්ටත්, වැඩිපුර ඉඳුණු මිනිස්සුන්ටත්, බලෙන් ඉදවාපු මිනිස්සුන්ටත් වඩා සුන්දර වන්නේ අත්දැකීමක් සමග පදමට පැහුණු මිනිසුන්ය."

මතු දිනක ලස්සන දියමන්තියක් වන්නේ
අධික උණුසුම සහ දැඩි පීඩනය යටතේ
කාලයක් පුරා වෙනස් වෙන කැත ගල් අඟුරු කුට්ටියකි.





මම හෙමින් ඇවිද යමි.
එහෙත්
මම කිසි දිනක
ආපස්සට ඇවිද නොයමි.


"සමහරු ජීවත් වෙන්න හදන්නේ
කවදාවත් මැරෙන්නේ නැති මිනිස්සු වගේ.
ඒත් ඒ අය මැරෙන්නේ කවදාවත් ජීවත්
නොවුණ මිනිස්සු වගේ."



කාලය ඔබව මහළු කරයි නමුත් සිද්ධි
ඔබව පරිණත කරයි.



සාර්ථකත්වය යනු අයිස් කන්දකි.





"සතුට පෙන්වීමට
Selfie ඕනි
සතුට විඳීමට
Selfie- less වෙන්න ඕනි."



කාටවත් ඔයාගෙ සිහින
හොරකම් කරන්න දෙන්න එපා.
ඔයාගෙ හීන වෙනුවෙන් සටන් කරන්න.
ඒ හීන ඔයාගෙම් වෙනකම්.



ශ්‍රේෂ්ඨ පුද්ගලයන් ඉහළ නැගුනේ
හදිසියේ පියාසර කිරීමෙන් නොවේ.
සගයන් රාත්‍රිය පුරා නිදා සිටියදී
ඉතා අසීරුවෙන් බඩ ගාමින්, වෙහෙසෙමින්
ඔවුහු මුදුනට පැමිණියෝය.

-ලෝන්ෆෙලෝ-

බොහෝ පරීක්ෂණ වලින්
හෙළිවුණ දෙය නම්,
ඕනෑම ක්ෂේත්‍රයක ප්‍රවීණයෙක් වෙන්න
අවම වශයෙන් පැය 10000ක
පුහුණුව අවශ්‍යයි.



කුඩයකට වැස්සක් නවත්තන්න බෑ
ඒත් කුඩය ඔයාව වැස්සෙන් ආරක්ෂා කරනවා.
ආත්ම විශ්වාසය සමහර විට
ඔයාව සාර්ථකත්වය කරාම ගෙන යන එකක් නෑ.
ඒත් ආත්ම විශ්වාසය
අභියෝග වලින් ඔයාව ආරක්ෂා කරනවා.

සතුට සත්‍යයෙන් අවබෝධ කරගත් විට නොනැසී පවතී.

# දැනුම වඩන්නයි - තෑගි දිනන්නයි
# මෙහෙවර පැණසර

## ප්‍රහේලිකා අංක 10

**ජයග්‍රාහකයින් තිදෙනෙකුට සදීපා ප්‍රකාශකයෝ වෙතින් රුපියල් 3000 වටිනා පොත් කට්ටල තුනක්**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | | 4 | | ■ | 3 | |
| ■ | | ■ | | ■ | 7 | | |
| ■ | 6 | | | 9 ම | ■ | 5 | |
| 8 | | ■ | | | ■ | | ■ |
| | | ■ | ■ | 12 | | ■ | 13 |
| 11 | | කි | | | ■ | ■ | |
| | ■ | ■ | ■ | 14 | | ■ | |
| 10 | | | ■ | 15 | | | |

මෙහෙවර පැණසර ප්‍රහේලිකාවේ බහුතරයක් උපකාරකයන් සැකසෙනුයේ මෙවර මෙහෙවර පුවත්පතේ පළව ඇති ලිපි වල අඩංගු කරුණු ඇසුරිනි. එම ලිපි කියැවූ ඔබට මෙම ප්‍රහේලිකාව පිරවීම කිසිසේත්ම අසීරු නොවනු ඇත. HNB ග්‍රාමීන් කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට මෙම තරඟය සඳහා සහභාගී විය හැකි අතර නිවැරදිව ප්‍රහේලිකාව පුරවා එවන්නන් අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගන්නා ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් තිදෙනෙකුට සදීපා පොත් ප්‍රකාශකයෝ වෙතින් අගනා පොත් පාර්සල් 3 ක් පිරිනමන අතර, ඔබගේ විසඳුම් ලබන මස 3 වන සතියට පෙර සංස්කාරක - මෙහෙවර පැණසර, HNB ග්‍රාමීන් අංක 168, නාවල පාර, නුගේගොඩ ලිපිනයට ලැබෙන්නට සලස්වන්න.

**උපකාරක,**

**හරහට :-**
1. ඉන්දීය සිනමාවේ සුපිරිතම නළුවන් අතර මුල් තැනක් ඔහුට හිමිය.
3. මේවා වදිනවාට කිසිවකුත් කැමැති නැත.
5. ලෙනින් විසින් ඝාතනය කරන ලද රුසියානු රජ පෙළපත මෙනමින් හැඳින්වේ.
6. පන්නිපිටියට නුදුරු ග්‍රාමයකි.
7. ස්ත්‍රීන් පළඳින ආභරණ විශේෂයකි.
8. "ආයුධ" යන අරුත් දේ.
10. "කීර්තිය" යන්නට සමාන අරුත් දෙන වචනයකි.
11. රාජකීයත්වය සංකේතවත් කරන පළඳනාවකි.
12. ඇතෙකුට ආභරණයකි.
14. වී වගා කරන කන්න දෙකෙන් එකකි.
15. ජසයා සහ.......යනු කෝලං නාට්‍යයන්හිදී හමුවන ප්‍රධාන චරිත දෙකකි

**පහලට :-**
2. ගස් වාසභවනය කරගත් දේවතා විශේෂයකි.
3. සුගතපාල ද සිල්වා විසින් නිෂ්පාදනය කරන ලද වේදිකා නාට්‍යයකි.
4. "සෝදා යාම" යන අරුත දේ.
8. කේ. ජයතිලක ශූරීන් විසින් රචිත කෙටිකතා සංග්‍රාහයකි.
9. බෙර විශේෂයක් වූ මෙය නාඩගම් සංගීත සම්ප්‍රදායේ එන ප්‍රධාන වාද්‍ය භාණ්ඩයකි.
13. දුටු ගැමුණු රජුගේ යෝධයකු වූ රිටිගල ජයසේන පසුව මෙනමින් යක්ෂයකු වූ බව ජනප්‍රවාදයෙහි එයි.

නම : ................................................ සේවක අංකය : ..........................
ශාඛාව : ........................................ ප්‍රහේලිකාව පිරවූයේ වෙනත් අයෙකු නම්
ඔහුගේ / නම : ....................................................
ඥාති සම්බන්ධය : ....................................................
දිනය : .............................. අත්සන : ..................................
මෙහෙවර පැණසර ප්‍රහේලිකා අංක 10

## මේ අයත් නිවැරදි විසඳුම් එවා තිබුණා

අමල්කා කුරේ - ප්‍රධාන කාර්යාලය.එම්.පී. රුසිරුප්‍රේමලාල්- කන්තලේ ශාඛාව, කේ.ඩී.පී.ෆොන්සේකා-හොරණ ශාඛාව, තුෂාර මුහුණ මල්වත්ත-ප්‍රධාන කාර්යාලය, එම්.පී.කේ.එන්. බාලසූරිය - පොළොන්නරුව ශාඛාව, චාමර තරංග පීරිස්-ප්‍රධාන කාර්යාලය, යූ.ජී.කේ.කේ. ගුණරත්න -කඩුවෙල ශාඛාව, පත්ම කුමාර-ප්‍රධාන කාර්යාලය, මිතිල පෙරේරා -ප්‍රධාන කාර්යාලය, එච්.පී. නිෂාදි නුවන්තිකා-කඩුවෙල ශාඛාව, අමල්හිල් බත්දෙණිය-ප්‍රධාන කාර්යාලය, එච්.පී.සී.බී.හරිස්චන්ද්‍ර-ප්‍රධාන කාර්යාලය, ටී.එම්. සුදත්ගම-ඇඹිලිපිටිය ශාඛාව, ලසානි දිනිතිකාර-ප්‍රධාන කාර්යාලය ,අසංක සුබාසිරි-ප්‍රධාන කාර්යාලය, බී. ඒ. ඩී. ඒ.තරිඳු-ප්‍රධාන කාර්යාලය, ප්‍රසාදිනීවීරකෝන් - ප්‍රධාන කාර්යාලය,මනෝරි ද සිල්වා-ඇඹිලිපිටියශාඛාව, කේ.එම්.ආර්.ඩී.බණ්ඩාර-නාවලපිටියශාඛාව, එච්.ඒ.පී.එම්.යූ. කුමාරි-කන්තලේ ශාඛාව, ඊ. ඉසුරි සයුරු, කේ.එල් සඳරුවන්-නාවලපිටිය ශාඛාව, ඩබ්.කේ.ඒ.ඒ. ලක්මාලි-මීගමුවශාඛාව, ඒ.ඒ.ඩී.අයි.ලක්ෂාන්-කඩුවෙල ශාඛාව, එම්.පී. ගයාන්චන්දිම-කඩුවෙල ශාඛාව, කේ.ඒ.ඒ.එන් පෙරේරා-කඩුවෙල ශාඛාව, එස්.එච්.පී. ප්‍රියන්ත කුමාර-කඩුවෙල ශාඛාව, ඒ.එස්. අබේසිරිවර්ධන -හම්බන්තොටශාඛාව, එස්. පී.නිශානි යසරත්න-හෝමාගම ශාඛාව, දිනේෂ් රත්නසේකර-ප්‍රධාන කාර්යාලය, ටී.එම්. වැකඩපොළ- රිකිල්ලගස්කඩ සේවා මධ්‍යස්ථානය, ඩී.එම්.එම්.ප්‍රනාන්දු- මීගමුව ශාඛාව, බී.එල්.සී.මධුෂානී-ප්‍රධාන කාර්යාලය, බී.එම්.එස්.පී.රත්නායක-බදුල්ල ශාඛාව, උදාරි ධර්මවර්ධන - ප්‍රධාන කාර්යාලය, ෂමීර කොතලාවල-ප්‍රධාන කාර්යාලය, තිවංකරාමනායක-කුරුණෑගල ශාඛාව, ප්‍රබෝධ ද සිල්වා - දෙහිඅත්තකණ්ඩිය සේවා මධ්‍යස්ථානය, එම්.සී.එස්.විජේරත්න - බලන්ගොඩ, චරිත් ප්‍රියනාත්-රිකිල්ලගස්කඩ සේවා මධ්‍යස්ථානය, කේ. එස්. චාමර-ඇඹිලිපිටිය ශාඛාව, අනුරාධ ඇපාසිංහ -ප්‍රධාන කාර්යාලය, දිලිනි දිසානායක-කුරුණෑගල ශාඛාව, ආර්.එම්.ජී.එම්. රත්නායක-රිකිල්ලගස්කඩ සේවා මධ්‍යස්ථානය, පී.ඒ.එස්.සම්පත් - දෙහිඅත්තකණ්ඩිය සේවා මධ්‍යස්ථානය, නිලාන් මල්වතුගොඩ - කුරුණෑගල ශාඛාව.

## මෙහෙවර පැණසර ප්‍රහේලිකා අංක 09
### නොවැම්බර් - දෙසැම්බර් කලාපයේ ජයග්‍රාහකයෝ



ප්‍රබෝධ ද සිල්වා
දෙහිඅත්තකණ්ඩිය
සේවා මධ්‍යස්ථානය



ඔකඳ ජයසිංහ
ප්‍රධාන කාර්යාලය



ජී. කේ. විතානගේ
කඩුවෙල ශාඛාව



මෙහෙවර පැණසර ප්‍රහේලිකාව පුරවා එවීමට ඔබ දක්වන උනන්දුව දිනෙන් දිනම ඉහළ යන බව සීඝ්‍රයෙන් වැඩිවන ඔබේ විසඳුම් පත් ප්‍රමාණය සාක්ෂි දරනවා. පසුගිය කලාපයේ පළවූ මෙහෙවර පැණසර ප්‍රහේලිකාව පුරවා එවූ ඔබ අතරින් කුසපත් ඇදීමෙන් තෝරා දැක්වෙනවා. මෙවර මෙහෙවර පැණසර ජයග්‍රහකයින් තේරීම සඳහා අප හා එක්වූ කොළඹ ප්‍රාදේශිකයේ ප්‍රාදේශීය කළමනාකරු සුජිත් කුමාර මහතාටත්, නගර ශාඛාවේ කළමනාකරු සුරංග හේරත් මහතාටත්,නගර ශාඛාවේ සහකාර කළමනාකරු ප්‍රියංකර පෙරේරා මහතාටත් අපගේ ස්තූතිය.

සදීපා

සම්මානලාභී බෞද්ධ, සාහිත්‍ය හා අධ්‍යාපන පොත් ප්‍රකාශකයෝ

Sole Agent in Sri Lanka
PELANGI
Penerbitan Sdn. Bhd.
Malaysia.

කුඩා ළමුන්ට මුල සිට සරලව ඉංග්‍රීසි ඉගෙනීම සඳහා මැලේසියාවෙන් ගෙන්වන Phonics පොත් පෙළ

• පොත් ප්‍රකාශනය • ප්‍රින්ට් හවුස්
• පොත් හල • ප්‍රින්ටර්ස්


ඝ/ස සදීපා ප්‍රකාශකයෝ
SADEEPA PUBLISHERS (PVT) LTD
1060, මරදාන පාර, බොරැල්ල

දුරකථන : 011-2686114, 2694289, 2678043
ෆැක්ස් : 011-2678044
Email : sadeepapub@gmail.com

තමන්ටත් කුමක් හෝ දෙයක් ඉතා විශිෂ්ඨ ලෙස කලහැකි බව අමතක නොකරන්න.

# Atlas සිත්තර යාළු
## පුංචි අපේ චිත්‍ර පිටුව

''සිත්තර යාළු'' චිත්‍ර පිටුව වෙන්වෙලා තියෙන්නේ එච් එන් බී ග්‍රාමීන් කාර්ය මණ්ඩලයේ ඔබේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළි දැක්වීම පිණිසයි. ''සිත්තර යාළු චිත්‍ර පිටුවෙහි පළවන චිත්‍ර අතරින් **තෝරා ගනු ලබන හොඳම චිත්‍ර තුනක් සඳහා සිලෝන් පෙන්සිල් කොම්පැණි (ඇට්ලස්) මගින් පිරිනමනු ලබන වටිනා ත්‍යාග කට්ටල තුනක් පිරිනමනු ලබන** අතර ඔබගේ දුවගේ පුතාගේ නිර්මාණ කුසලතාව එළිදක්වාලීමට ලැබෙන මේ මාහැඟි අවස්ථාව ප්‍රයෝජනයට ගෙන **ඔබේ දරුවාගේ චිත්‍ර නිර්මාණ සංස්කාරක, චිත්‍ර පිටුව,** HNB **ග්‍රාමීන් ගොඩනැගිල්ල, අංක 168, නාවල පාර , නුගේගොඩ. යන ලිපිනයට නොපමාව යොමු කරන්න.**



ගොයම් නෙළන ලඳුන්
K. මල්මි කාවයා
(K. රන්ජන් - පුත්තලම් ශාඛාව)



දුන්හිඳ දිය ඇල්ල
සඳුප රණවීර
(R. කමල් රණවීර - ප්‍රධාන කාර්යාලය)



අපේ ගෙදර
R.M. සයුනි සෙනෙත්මා රණසිංහ - පෙර පාසල
(R.M. චන්දන රණසිංහ - ගල්ගමුව ශාඛාව)



සුන්දර දියඇල්ලක්
T.M. නෙත්මි සත්සරණි - 4 ශ්‍රේණිය
(T.M.G. තිලකරත්න - නිකවැරටිය ශාඛාව)



අපේ ගෙදර
K.K.D. සෙනුත් නෙත්මිර - 01 ශ්‍රේණිය
(K.K.D නලින් ගුණවර්ධන - කළුතර ශාඛාව)



මාළු ටැංකිය
T.M. සෙනුවි යුතාරා - පෙර පාසල
(T.M. රසික ප්‍රේමලාල් - හලාවත ශාඛාව)



අපේ වත්ත
L.D. සමීරා ආකේෂි
(L.D.P. මදුසංක - ජාඇල ශාඛාව)



දිය කිඳුරියෝ ගොඩට ඇවිත්
S.M. නිකිණි දිනෙත්මා- 1 ශ්‍රේණිය
(S.M. මහේෂ් උදය - අම්බලන්ගොඩ ශාඛාව)

## මෙහවර සැප්තැම්බර් - ඔක්තෝබර් කලාපවල ජයග්‍රාහී දූ පුතුන්

මෙහෙවර සිත්තර යාළු වෙත චිත්‍ර ඇඳ එවා පසුගිය සැප්තැම්බර් / ඔක්තෝබර් කලාපයන්හි ජයග්‍රහනය ලැබූ වාසනාවන්ත දූ දරුවන් අතුරින් පහත නම් සඳහන් දරුවන් තිදෙනා තමන් ලද ත්‍යාගය සමග ඡායාරූප අපවෙත එවා තිබුණා.

ජයග්‍රහණය ලද වාසනාවන්ත දරුවන් සියලු දෙනාටම අපගේ උණුසුම් සුභ පැතුම්..



උතුල් බුද්මිණ



නිකිණි දිනෙත්මා



කවින් රන්දිව්

## Atlas සිත්තර යාළු
### නොවැම්බර් - දෙසැම්බර් කලාපයේ ජයග්‍රාහකයෝ

- **මගේ මල්වත්ත**
  සෙනුමි යුතාරා 3 ශ්‍රේණිය
  (රසික ප්‍රේමලාල් - හලාවත ශාඛාව)
- **ගමේසරුංගල් තරගය**
  විදූෂ ජයවීර - 1 ශ්‍රේණිය
  (සඳරුවන් ජයවීර - ප්‍රධාන කාර්යාලය)
- **වනයක අසිරිය**
  හිරුණි දේවින්දි - 6 ශ්‍රේණිය
  අජිත් කරුණාරත්න - පොළොන්නරුව ශාඛාව

